# ගාලු කොටුවේ ඉදි කිරීම් තාක්ෂණය පිළිබඳ විමර්ශනයක්

ටී. එස්. ලක්ෂාන්[1]

දකුණු පළාතේ අග නගරය වන ගාල්ල එහි කොටු පවුර නිසා සුවිශේෂත්වයට පත් වූවකි. යටත්විජිත යුගයේ දී ගාලු තුඩුවෙහි වටිනාකම හඳුනාගත් පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසිහු ගාලු කොටුව තම ප්‍රධාන මධ්‍යස්ථානය වශයෙන් භාවිත කළහ. පෘතුගීසීන් ගාල්ලේ මුලින් ම ආරම්භ කළේ ගබඩාවකි. 1602 දී ස්ථිර බළකොටුවක් බවට පත් වූ මෙය වෙඩි බෙහෙත් ගබඩා, ලැගුම් හල්, සිර ගෙවල්, ශාලා හා උමංවලින් සමන්විත වී ඇත. ලන්දේසීන් සිය යටත් විජිත පාලන සමයයේ දී මේ කොටුව නැවත ගොඩනැගූ අතර සමස්ත ගාලු තුඩුව ම භාවිත කරමින් ශක්තිමත් බළකොටුවක් නිර්මාණය කිරීමේ ගෞරවය ඔවුහු හිමිකර ගත්හ. ඔවුන් ගොඩබිමෙන් සහ මුහුදෙන් යන දෙපසින් ම ආරක්ෂා වන පරිදි මුර අට්ටාල ඉදි කළ අතර සන්, මූන් හා ස්ටාර් යන ප්‍රධාන අට්ටාල ත්‍රිත්වය ගොඩබිම දෙසින් ආරක්ෂාවටත් කොමාඩ්මන්, ෆිස්ටාර්ක්, ඊලොස්, ක්ලිපන්බර්ග්, නෙප්චූන්, ට්‍රිටන්, ෆ්ලැග්රොක්, උට්රිච්, ඇව්රෝරා හා ඇකර්ලූට් යන අට්ටාල මුහුද දෙසින් ආරක්ෂාව උදෙසාත් ඉදි කරන ලදි. මේ මුර අට්ටාල සඳහා විශේෂිත වූ කාර්ය වී ය. ඊට අමතර ව වෙඩි බෙහෙත් ගබඩා, සිරකුටි, බඩුගබඩා, රෝහල්, දේවස්ථාන, පරිපාලන නිලධාරී නිලනිවාස ආදියෙන් ගාලු කොටුව සමන්විත ව තිබිණි. මේ ගොඩනැගිලි ඉදි කිරීමේ දී භාවිත වූ තාක්ෂණය ද ඉතා ඉහළ ය. වෙඩි බෙහෙත් ගබඩා ඉදි කිරීමේ දී හදිසි අවස්ථාවක දී සිදු විය හැකි විනාශය අවම කරගැනීමට හැකි තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කර තිබිණි. එමෙන් ම කාණු පද්ධතිය පිරිසිදු කිරීමට වඩදිය හා බාදිය උපකාර කොටගෙන ඇති තාක්ෂණය ද ඉතා ඉහළ ය. කොටුවේ වීදි මධ්‍යයේ වූ භූමිය චතුරස්‍රාකාර කොටස්වලට බෙදී යන පරිදි සකස් වී තිබේ. මේවාට ලන්දේසි යුගයේ දී භාවිත කළ වීදි නාම අද දක්වා ම භාවිත වේ. මැද වීදිය, පල්ලිය වීදිය, පෙඩ්ලර් වීදිය, ලේන්බාන් වීදිය, මඩවල වීදිය ආදිය ඒ අතර වේ. ඉංග්‍රීසීන් ගාලු කොටුව යටත් කරගැනීමෙන් පසු ව විවිධ වෙනස්කම් මෙහි සිදු කළ අතර නවාංග රැසක් මෙයට එකතු කිරීම ද ඔවුනතින් සිදු විය. සමස්තයක් ලෙස ගත් කල යටත් විජිත යුගයේ නිර්මාණය වූ බළකොටු අතුරින් විශිෂ්ටතම නිර්මාණය ගාලු කොටුව ලෙස හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** තාක්ෂණික ක්‍රමවේද, බළකොටු, ආරක්ෂිත උපක්‍රම, නැවත ගොඩ නැගීම, යටත්විජිත යුගය

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසගිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය